156404

# පුස්තකාල ප්‍රවෘත්ති

පටුන


* කියවීමේ රුචිය තැංවීමේ නව වැඩ පිළිවෙළක් 1 - 3

* ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පුස්තකාල සේවීන් පුහුණු කරයි 5 - 6

* වාණිජ තොරතුරු සේවා පුස්තකාලය 7 - 15

* විවේකයෙන් වැඩිම වේලාව කියවීමට ගත කරන ජනතාවක් - 16

* මණ්ඩලීය පුවත් 17 - 18

* පොත් පුවත් 19 - 20


6 වන කලාපය - අංක 1 1978 ජනවාරි/මාර්තු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

" පුස්තකාල ප්‍රවෘත්ති "

6 වන කලාපය – අංක: 1

1978 ජනවාරි/මාර්තු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ත්‍රෛමාසික ප්‍රකාශනය

සංස්කරණය හා ප්‍රකාශනය:

පුස්තකාල අධ්‍යාපන හා අභ්‍යාස අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

සියළුම ලිපි හා විමසීම්:

සහකාර අධ්‍යක්ෂ (පුස්තකාල අධ්‍යාපන)
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
74, ඩේවිඩ්සන් පාර, කොළඹ 4.

දුරකථනය: 82243

මෙහි පළවන අදහස් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම අදාල ලේඛකයන් වෙත පැවරේ.

## ප්‍ර කා ශ න

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින්

ප්‍රකාශිත පොතපත

* මහජන පුස්තකාල ප්‍රමිති

  සංස්කරණය:

  ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

  මිල රු. 4.00

* ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

  වාර්ෂික දායක මුදල රු.45.00 (තැ.ගා.සමග)

* පුස්තකාල ප්‍රවෘත්ති

  සිංහල/දෙමල/ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන්

  ත්‍රෛමාසික ප්‍රකාශනය - තොමිලයේ සැපයේ

* Catlogue of Postgraduate Dissertations in the Lib raries of Sri Lanka

  Comp. by N.Amarasinghe (Unpriced)

ලියුම්, මුදල් ඇණවුම් හෝ චෙක්පත් පහත ලිපිනයට:

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

74, ඩේවිඩ්සන් පාර, කොළඹ 4. ටැලි: 82243

# කියවීමේ රුචිය තැංවීමේ නව වැඩ පිළිවෙලක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පොත් හුවමාරු සේවාවට වර්ෂයක් ඉකුත් වී ඇත. දැනට ශ්‍රී ලංකාවේ භාවිතා කරන පොත් බෙදා හැරීමේ ක්‍රමවල නව පිටුවක් පෙරලූ මෙම පොත් හුවමාරු සේවාව අන් ක්‍රමවලට වඩා වෙනස් වෙයි. එමෙන්ම, පුස්තකාල සේවාවන් අතරින් ඉතාම ජනප්‍රිය වූත්, සාර්ථක වූත් සේවාවක්ද වෙයි. පොත් හුවමාරු සේවාව ශ්‍රී ලංකාවට හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවයට දෙන ලද පිටුවහල ඉමහති.

පොත් හුවමාරු සේවාව ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ පොතපත මහජනයා අතර ජනප්‍රිය කිරීම හා කියවීමේ රුචිය ඔවුන් අතර වැඩි දියුණු කිරීමත්ය. පුස්තකාලවලට පොත්පත් මිලදී ගැනීම සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ඉතාම සීමාසහිත නිසා, මහජන හා පාසල් පුස්තකාල අතලොස්සක් හැරෙන්නට ගම්බද ප්‍රදේශවල පිහිටි පුස්තකාලවලට ලැබෙන පොත් සංඛ්‍යාව කිසිසේත් ප්‍රමාණවත් නොවේ.

තවද මුද්‍රණ වියදම හා කඩදාසි මිල අධිකවීම ආදී හේතූන් නිසා පොත්පත්වල මිල ඉතා දැඩි ලෙස ඉහල යාම හේතුකොට ගෙන මහජනයාට හා පාසල් සිසුන්ට ඔවුන්-ගේ නොයෙකුත් කියවීමේ අවශ්‍යතාවනට සරිලන පොතපත මිලදී ගැනීම ඉතාම අසීරු කරුණකි. මෙවැනි අවදියක ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් මහජන හා පාසල් පුස්තකාලවලට - පොත් හුවමාරු සේවාව මත පොත් සැපයීම ඉතාම කාලෝචිත වේ.

පොත් හුවමාරු සේවාවේ සාමාජිකත්වය ලබන සෑම මහජන හා පාසල් පුස්තකාල -යකටම <u>තෙමසකට වරක්</u> පුස්තකාල සේවා මණ්ඩලයේ කොළඹ ප්‍රධාන කාර්යාලය හෝ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් 100 කට නොවැඩි වූත්, 50 කට නොඅඩු වූත් පොත් කට්ටලයක් සපයනු ලැබේ. මෙසේ පොත් සපයනු ලබන්නේ රු.100/-ක තැන්පත් මුදලක් පුස්තකාල සේවා මණ්ඩලයේ තැන්පත් කිරීමෙන් මෙම සේවාවේ සාමාජි-කත්වය ලබා ගන්නා පුස්තකාලවලට පමණි. මෙම පොත් කට්ටල සාමාජික පුස්තකාල කරා ප්‍රවාහනය කරනු ලබන්නේ දුම්රිය මගින් වන අතර, එම ප්‍රවාහන වියදම පුස්ත -කාල සේවා මණ්ඩලය මගින් දරනු ලැබේ.

සාමාජික පුස්තකාලයකට වරකට සැපයිය යුතු පොත් සංඛ්‍යාව කොපමණදැයි නිගමනය කරනු ලබන්නේ එම පුස්තකාලයේ පොත් සංඛ්‍යාවත්, ලියා පදිංචි පාඨක

සංඛ්‍යාවත් සංසන්දනය කිරීමෙනි. මෙසේ පුස්තකාලයක් සතු පොත් සංඛ්‍යාව එහි ලියා පදිංචි පාඨක සංඛ්‍යාවෙන් බෙදූ විට එක පාඨකයකු සඳහා කොපමණ පොත් සංඛ්‍යාවක් පුස්තකාලයේ තිබේදැයි නිගමනය කළ හැකිය. මෙම නිගමනය අනුව, සාමාජික පුස්තකාලවලට තුන් මසකට වරක් ග්‍රන්ථ නාම 50 කින්, 60 කින්, 75 කින්, 85 කින් හෝ 100 කින් යුක්ත වූ පොත් කට්ටලය බැගින් සපයනු ලැබේ. මෙසේ එක් එක් පුස්තකාලයට පොත් හුවමාරු සේවාව මත ලැබෙන පොත් සංඛ්‍යාව අවුරුද්දක් තුළ නොවෙනස්ව පවතින අතර, එහි වෙනසක් සිදුවන්නේ අවුරුද්දක් ගතවීමෙන් පසුව එම පුස්තකාල පොත් සම්පත් අතින් හා ලියා පදිංචි පාඨක සංඛ්‍යාව අතින් ලබා ඇති දියුණුව අනුවය.

පොත් හුවමාරු සේවාව මත බෙදා හරිනු ලබන පොත් සිංහල, දෙමල හා ඉංග්‍රීසි භාෂාවලින් ලියවුණු ඒවා වන අතර, ශාස්ත්‍රීය ප්‍රබන්ධ හා ළමා කතින් මේ කට්ටලවලට ඇතුළත් කරනු ලැබේ. එක් පොත් කට්ටලයකට අයත් ග්‍රන්ථ නාමවලින් සාමාන්‍යයෙන් සියයට 75 ක් සිංහල පොත් වන අතර, ඉතිරි සියයට 25 දෙමල හා ඉංග්‍රීසි පොත් වෙනත්, දෙමල හා මුස්ලිම් පාඨකයන් වැඩි වශයෙන් සිටින පාසල් හා මහජන පුස්තකාලවලට පොත් සැපයීමේදී මෙම අනුපාතය වෙනස් වේ.

පුස්තකාලවලට අවශ්‍ය වන පොත්පත් මිලදී ගැනීම සඳහා වාර්ෂිකව සෑහෙන මුදලක් වෙන් කිරීමට තරම් යහපත් ආදායම් මාර්ග නොමැති අපගේ ග්‍රාමීය මහජන හා පාසල් පුස්තකාලවලට පොත් හුවමාරු සේවාවෙන් විශාල සේවයක් සිදු වී තිබෙන බව නොකිව මනාය. ඉහත දැක්වූ පරිදි අවම වශයෙන් ග්‍රන්ථ නාම 50 ක්වත් තුන් මසකට වරක් සාමාජික පුස්තකාලවලට ලැබීමෙන් වසරක් තුළ එම පුස්තකාලවලට ග්‍රන්ථ නාම 200 ක් තමන්ගේ ලියා පදිංචි පාඨකයන් අතර බෙදා හැරීම සඳහා ලැබේ.

මෙම සංඛ්‍යාව පුස්තකාල ලබා ඇති දියුණුව හා ඒවායේ අවශ්‍යතාවයන් අනුව වර්ෂයක් තුළ 400 දක්වා වැඩි වේ. පොත්වල මිල බලන විට අධිකව ඇති සමයක සාමාන්‍ය වශයෙන් පොතක මිල රු.7.50 ක් පමණ වේ. මේ අනුව සලකා බලන විට රු.100/- ක මුදලක් තැන්පත් කිරීමෙන් සාමාජික පුස්තකාලයකට එක් වරකට අවම වශයෙන් ග්‍රන්ථ නාම 50 ක් ලැබෙන විට රු.375/- ක් පමණ වටිනා පොත් කට්ටලයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් ලබා ගත හැකිවේ.

මෙවැනි පොත් කට්ටල හතරක් වසරක් තුළදී ලැබීමෙන් රු.1500/-ක් පමණ වටිනා පොත් ලබා ගැනීම සඳහා සාමාජික පුස්තකාලයක් විසින් යෙදවිය යුතු මුදල රු.100/-ක් පමණය. එයද තැන්පත් මුදලක් පමණක් වේ. එහෙත් එමගින් ලැබෙන සේවාව අති විශාලය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පොත් හුවමාරු සේවාව මත පුස්තකාලවලට පොත් සැපයීම සඳහා විශාල මුදලක් වැය කරයි. අවශ්‍ය පොත් මිලදී

ගැනීමට පොත් පෙට්ටි හා ඉබි යතුරු මිලදී ගැනීමට හා පොත් සාමාජික පුස්තකාල කරා දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමට මෙසේ මුදල් වැය කෙරේ. මෙතරම් විශාල මුදලක් යොදවමින් බලාපොරොත්තු වන්නේ පොතපත මහජනයා අතර වඩ වඩාත් පත් කිරීමෙන් ඔවුන්ගේ සාමාන්‍ය බුද්ධිය දියුණු කිරීමටත්, පාසල් සිසු දරුවන්ට ඔවුන්ගේ ඉගෙනීමේ කටයුතු හා විභාග සඳහා අවශ්‍ය පොතපත ලබාදීමත් පමණක් නොව, ජනතාවගේ විවේක කාලය ඔවුනට ප්‍රයෝජනවත් අයුරින් ගත කිරීමට හුරු පුරුදු කිරීමත්ය.

"කියවීම මිනිසා සම්පූර්ණ කරයි" යන පඩි වදන සැබෑ කරමින් කියවීමට හුරු පුරුදු වූ පුද්ගලයා – පුද්ගලිකව තමාට එයින් සෙත සලසා ගන්නවා පමණක් නොව, තමා ලබා ගත් දැනුම ඇසුරින් තමා ජීවත් වන සමාජයට සේවයක් කිරීමටද ඉදිරිපත් වේ.

දැනට මෙම සේවාව මහජන පුස්තකාලවලට හා පාසල් පුස්තකාලවලට පමණක් සීමා වුවද, නුදුරු අනාගතයේදී එය ආරොග්‍ය ශාලා, වැඩිහිටි නිවාස, බන්ධනාගාර හා එළිමහන් සිර කඳවුරු ආදී විවිධ ආයතන අතරද, ව්‍යාප්ත කිරීමටත් පුස්තකාල සේවා මණ්ඩලය බලාපොරොත්තු වේ. මෙම ආයතනවල නැවතී සිටින අයට ඔවුන් –ගේ විවේක කාලයේදී කියවීමට පොතපත ලබා ගැනීමෙන් යම්කිසි ආස්වාදයක් ලබා ගන්නා අතර, තමන්ගේ දැනුම පුළුල් කර ගැනීමටද මග සලසා ගන්නවා ඇත.

මිනිසාගේ කුසට ආහාර යම් සේ අවශ්‍ය වන්නේද, එමෙන්ම මනසටද ආහාර අවශ්‍ය වේ. මනසට අවශ්‍ය මෙම ආහාරය පොතපතයි. දිනපතා පොතපත කියවීමට හුරු පුරුදු පුද්ගලයා එමගින් ඔහුගේ මනස වඩ වඩා දියුණු කර ගන්නවාට සැකයක් නැත. මනස වැඩි දියුණු වෙත්ම, මිනිසා පොතපත වඩ වඩාත් ඇසුරු කරයි. මේ අයුරින් පොතපත වඩ වඩාත් කියවීමට පෙළඹුන පුද්ගලයා ඔහුගේ මානසික ශක්තිය ක්‍රමයෙන් වැඩි දියුණු කර ගනී. ඒ අනුව යම් රටක පොත්පත භාවිතා වන අනුපාතය අනුව, ඒ රටේ ප්‍රජාවගේ බුද්ධි විකාශනයද ඇති වේ.

– ජේ. එල්. පණ්ඩිතරත්න

## 1979 ජාත්‍යන්තර ළමා වර්ෂය : විශේෂාංග

### ජාත්‍යන්තර ළමා පොත් ප්‍රදර්ශණයක්

1979 ජාත්‍යන්තර ළමා වර්ෂය නිසා ෆ්‍රෑන්ක්ෆර්ට් පොත් සල්පිල තම 1978 වර්ෂයේ වැඩ සටහන ළමයා සහ පොත මාතෘකාවට අවධානය යොමු කරමින් සකස් කර ඇත. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරෙන විවිධ වැඩ සටහන් අතර, ලෝකයේ සෑම රටක්ම පාහේ සහභාගි වන ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශණය වැදගත් තැනක් ගනු ලබයි.

දැනට ලෝකයේ ළමයින් සඳහා ලියැවෙන පොත්පත්වල තත්වය මැන ගැනීමට මෙම ප්‍රදර්ශණය ඉමහත් ආධාරයක් වනු නොඅනුමාන බව දැක්වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 144 තුළ ප්‍රකාශිත හොඳම ළමා පොත් මේ ප්‍රදර්ශණයට ඇතුළත් වනු ඇත. මේ සඳහා 1970 න් පසු තම රටවල ප්‍රකාශිත වූ ළමා පොත් අතුරින් හොඳම ග්‍රන්ථ 50 ක් තෝරා එවන මෙන් මෙම රටවලින් ඉල්ලීමක් කර ඇත. අවශ්‍ය තරම් ළමා පොත් ප්‍රකාශනය නොවූ රටවලින් ඒ සඳහා පාසල් පොත් එවිය හැකි වුවත්, වැදගත් කොන්දේසියක් වනුයේ මේ සෑම පොතක්ම එම රටේම මුලික වශයෙන් පළ වූවක් විය යුතු අතර, කිසිම අන්දමකින් එය විදේශ භාෂාවකින් පරිවර්තනයක් නොවිය යුතු වීමයි.

මෙම ප්‍රදර්ශණය රටවල් කිහිපයකම පැවැත්වීමට අපේක්ෂා කරන අතර, මේ ආශ්‍රයෙන් අන්තර් ජාතික ළමා පොත් පිළිබඳ තෝරා ගත් ග්‍රන්ථ නාමාවලියක්ද පළ කිරීමට කටයුතු පිළියෙල කර ඇත.

## ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පුස්තකාල සේවින් පුහුණු කරයි !

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, සේවයේ නියුක්ත පුස්තකාල සේවින් පුහුණු කරලීමේ වැඩ පිළිවෙල 1978 වර්ෂය තුළදී වඩාත් පුළුල් අන්දමින් ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත. ශ්‍රී ලංකාවේ ඇති පුස්තකාල රාශියක පුස්තකාල සේවින් වශයෙන් සේවය කරන්නන්ට ඒ සඳහා අවශ්‍ය විෂය දැනුම හෝ පුහුණුව නොමැති බව සොයා ගෙන තිබේ.

විශේෂයෙන්ම මහජන පුස්තකාල හා පාසල් පුස්තකාලවල සේවය කරන කාර්ය මණ්ඩලයෙන් වැඩි දෙනෙකුට ඒ සඳහා අවශ්‍ය වන පුස්තකාල විද්‍යා දැනුමක් නොමැතිවීම, එම පුස්තකාලවලින් අපේක්ෂිත සේවය නිසි අයුරින් ඉටු නොවීමේ ලා ප්‍රබල හේතුවක් වී ඇත.

මෙයට පිළියමක් වශයෙන් මෙම පුස්තකාල සේවීන් කණ්ඩායම් වශයෙන් රැස් කරවා පන්ති පැවැත්වීම හා සම්මන්ත්‍රණ සංවිධානය කරලීම ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් කරගෙන යනු ලැබේ.

මෙම පන්ති හා සාකච්ඡා සම්මේලනවලදී සංවර්ධනය වන්නා වූ රටක පුස්තකාලය මගින් ඉටු කළ යුතු කාර්ය භාරය, එය මහජනතාව සමග සබඳතා පැවැත්විය යුතු ආකාරය, පොත්පත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍යයන් හොඳින් සංවිධානය කොට තබා ගත යුතු අන්දම, පොත් ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ, දේශන ආදිය මගින් පාඨකයන් පුස්තකාල වෙත ගෙන්වා ගැනීම, තාක්ෂණික සේවා සහ නූතන යුගයේ පුස්තකාල සංකල්පය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දෙනු ලැබේ.

මහජන පුස්තකාල සේවීන් පුහුණු කරලීම පළාත් පාලන අමාත්‍යාංශයේ, පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණායතනය සමගත්, පාසල් පුස්තකාල සේවීන් පුහුණු කරලීම අධ්‍යාපන අමාත්‍යාංශය සමගත් සහයෝගීත්වයෙන් කරනු ලැබේ.

මීට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ හා පන්ති සඳහා ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පුස්තකාල විද්‍යාව පිළිබඳ පුහුණු දේශකයන් සැපයීමෙන් ආධාර කරනු ලබයි. ව්‍යාප්ත

1978 වර්ෂය සඳහා සකස් කර ඇති/වැඩ පිළිවෙල අනුව, පාසල්වල ගුරු පුස්තකාල සේවීන් පමණක් නොව, විදුහල්පතිවරුන් හා මාණ්ඩලික නිලධාරීන්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ සහාය ඇතිව සම්මන්ත්‍රණයන් සඳහා සහභාගි කරවා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

(...6...ඉදිරි පිටුවට-

ජාතික පුස්තකාල සේවා මණ්ඩලය....(පසු පිට හා සම්බන්ධයි)

මෙම වර්ෂයේ ප්‍රථම පාඨ මාලාව පෙබරවාරි මස 13 වන දින සිට 17 වන දින දක්වා කොළඹ පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මහජන පුස්තකාල සේවීන් සඳහා පවත්වන ලදී. මේ හැර ගුරු පුස්තකාල සේවීන් සඳහා වූ ප්‍රථම පාඨ මාලාව පසුගිය මාර්තු මස 27 වන දින සිට 31 වන දින දක්වා තිට්ටඹුව ගුරු විද්‍යාලයේදී පැවැත්විණි.

පුස්තකාල සේවීන් පුහුණු කරලීම සඳහා ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ගෙන යනු ලබන මෙම වැඩ පිළිවෙලට චිත්‍රපට, පොත්පත් හා වෙනත් තොරතුරු සැපයීමෙන් ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය ආධාර කරනු ලබයි.

---

ප්‍රජා මණ්ඩල නිලධාරීන් සඳහා

පුස්තකාල විද්‍යා පුහුණුවක්

---

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රජා මණ්ඩල නිලධාරීන් සඳහා රත්නපුර නගර ශාලාවේදී මෙම වර්ෂයේ පෙබරවාරි මස 28 වන දින පවත්වන ලද සම්මන්ත්‍රණයකදී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් සහභාගි වූ අය සඳහා පුස්තකාල විද්‍යා පුහුණුවක් ලබා දෙන ලදී. මෙහිදී ප්‍රජා මණ්ඩල පුස්තකාලයක් සංවිධානය කරන ආකාරය, පුස්තකාලය සහ ගම අතර පැවතිය යුතු සබඳතාවය වැනි කරුණු පිළිබඳව විශේෂයෙන් අවධාරණය කරන ලදී. ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් මෙම ප්‍රජා මණ්ඩල පුස්තකාල සඳහා සැපයිය හැකි සේවාවන් පිළිබඳ පැහැදිලි කිරීමක් සාකච්ඡාවාරයේදී කරන ලදී.

මෙම සම්මන්ත්‍රණයට ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙන් මණ්ඩලීය සභාපති අධිනීතිඥ එම්.ඒ.ගුණතිලක මහතා, අධ්‍යක්ෂ එන්.අමරසිංහ මහතා, පුස්තකාල අධ්‍යාපන හා අභ්‍යාස පිළිබඳ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ එම්.එස්.යූ.අමරසිරි යන මහත්වරු සහභාගි වූ අතර, කොළඹ මහජන පුස්තකාලයේ නියෝජ්‍ය පුස්තකාලයාධිපති ටී.ඩී.ඩී.ගුණසේකර මහතාද මණ්ඩලයේ ආරාධනය පරිදි මෙයට සහභාගි විය.

---

වාණිජ තොරතුරු සේවා පුස්තකාලය

වෙළඳ අමාත්‍යාංශය

---

පුස්තකාලයාධිපතිනි

අයන්ති පෙස්ටම්ජි

විසිනි

වාණිජ තොරතුරු සේවා පුස්තකාලය ස්ථාපිත කරන ලද්දේ කලක් තිස්සේ අඩුපාඩුවක්ව පැවති වාණිජ හා ආර්ථික කටයුතු පිළිබඳ අනූන වශයෙන් තොරතුරු එක් කිරීමේත්, අත්‍යාවශ්‍ය තොරතුරු සැපයීමේත් පරමාර්ථයෙනි. විශේෂයෙන් අපගේ පුස්තකාල සේවාවෙහි අනුග්‍රහය ලබන පිරිස වූ කලි, ආනයනය හා අපනයනය කටයුතුවල නිරත වූවන්, වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ආනයන සංවර්ධන මහ ලේකම් කාර්යාලය සහ ඊට සමාතර වූ මෙම විෂය පථයට අයත් රජයේ දෙපාර්තමේන්තු, ආයතන, වෙළඳ සංවර්ධන සංවිධාන සහ මෙම විෂය පිළිබඳ පර්යේෂකයන් වෙති.

පුළුල් පරමාර්ථය වශයෙන් සඳහන් කරතොත්, වාණිජ තොරතුරු සැපයීමේ මූලික අධ්‍යාශය වනුයේ අපනයන කටයුතු වර්ධනය කරලීමයි. සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය කිරීමට සියලුම සහායයන් දෙමින්, ඒ මගින් ඊටට අතිශයන් වැදගත් වන ආනයනන් සඳහා අවශ්‍ය විදේශ විනිමය ලබා ගැනීමත්, නව රැකීරක්ෂා සඳහා මාර්ග ඇති කරලීමත් යනුවෙන් මෙම උත්සාහය රජයේ ආර්ථික ප්‍රතිපත්තියට අනුකූල භාවය දක්වන්නක්ද වේ. මෙවන් ධෛර්ය දීමක පල වශයෙන්, විශේෂයෙන්ම සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය සම්බන්ධයෙන් ඊට අදාල තොරතුරු දැන ගැනීමෙහි අවශ්‍යතාවෙහි වැඩි වර්ධනයක් දක්නට ලැබෙනවා සේම, එම ඉල්ලුම සපුරාලීමට වාණිජ තොරතුරු සේවා මගින් හැම අතින්ම ප්‍රයත්න දරනු ලබයි.

නිෂ්පාදන පුවත්, වෙළඳ පල පුවත් සහ ආයතන පුවත්, ප්‍රවෘත්ති විශේෂීකරණය කරනු ලබන ප්‍රධාන අංශයන් වේ. වාණිජ තොරතුරු සේවාව මෙතිසාම තත්කාලීන තොරතුරු එක් රැස් කිරීමේ මධ්‍යස්ථානයක් (බැංකුවක්) වශයෙන් ඊට සමාන්තර වූ ශ්‍රී ලංකා අපනයන වෙළඳාම සහ එම ක්ෂේත්‍රයට අදාල වූ සංඛ්‍යා ලේඛනාත්මක, ආර්ථික තොරතුරු එක්රැස් කර පවත්වාගෙන යයි. තවද මෙමගින් දියුණු කිරීමේ හැකියාව ඇති අපනයන කරුවන් ඊට තව තවත් පොළඹා ලන සුලු උපදෙස් දීමට හැකි හැම අයුරකින්ම උත්සාහ දරයි. එය අපනයන සංවර්

-ධන අංශයේ පර්යේෂණ කටයුතුවලට සහ පුහුණු කිරීම්වලටද සහාය දෙයි.

## ඓතිහාසික පසුබිම:

වාණිජ තොරතුරු සේවාවේ ඉතිහාසය පිළිබඳව තොරතුරු බිඳක් මෙහිදී මා ඔබට දක්වා සිටින්නේ එමගින් ශ්‍රී ලංකාවේ ඉතාමත්ම වැදගත් ප්‍රලේඛන මධ්‍යස්ථා-නයක් පිහිටුවීම පිළිබඳ සිදුවීම වඩාත් හොඳින් ග්‍රහණය කර ගැනීමට ඉඩ සලසා දීමේ පරාමාර්ථයෙනි. 1972 ඔක්තෝබර් මස ආරම්භ කරන්නට යෙදුන මෙම ආයතනය, එවකට ඉතා කුඩා කාර්ය මණ්ඩලයකින් සමන්විත විය. එය සිය කටයුතු නිල වශයෙන් ඇරඹුවේ 1973 ජනවාරි මසදිය. සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අපනයන සංවර්ධන අංශයේ සහ වෙළඳ අමාත්‍යාංශයේ වාණිජ දෙපාර්තමේන්තුවේ සහයෝගිත්වයෙන් ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය, ස්විඩන් ජාත්‍යන්තර සංවර්ධන ඇකඩමිය, ශ්‍රී ලංකා ජන රජයේ අපනයන සංවර්ධන වැඩ පිළිවෙල යන අංශවල ආධාර ඇතිව වාණිජ තොරතුරු සේවාව පිහිටුවන්නට යෙදිණි.

එම ආයතනය කොළඹ 3 හි, ගෝල්ෆේස් කෝට් අංක: 2 හි අංක: 31 දරණ කොටසේ පවත්වාගෙන යන අතර, වාණිජ දෙපාර්තමේන්තුව හා සම්-පත්වයකින් යුතුව පිහිටා ඇත. එහි පළමුවන අධ්‍යක්ෂවරිය ලෙස සෝමා ගුණ තිලක මහත්මිය එය නිල වශයෙන් ආරම්භ වූ තැන් පටන්ම ක්‍රියා කරන්නීය. වාණිජ තොරතුරු සේවාවට ඇගේ උද්‍යෝගිමත් භාවය බෙහෙවින් උපස්ථම්භක වී ඇති අතර, පුස්තකාලයේ එක් රැස්ව ඇති තොරතුරු සම්භාරය ඇගේ දූරදක්ෂතා හා ඉතා පරිස්සකාරී සැලසුම් කිරීම නිසාම ඇති වූවකි. ඉතාම කෙටි කාලයකදී ඇය වාණිජ තොරතුරු සේවාව හා පුස්තකාලය දියුත් කිරීමටද සමත් වූවාය. ඒ සමගම එය ශීඝ්‍ර කාර්ය ශූරත්වයක් සහිත වාතාවරණයක් සකසා දීමටද හැකියාව ඇති කළාය.

වාණිජ තොරතුරු සේවාව සැලසුම් කිරීම, ලී බඩු සහ උපකරණ තීරණය කිරීම හා එහි ප්‍රකාශන පිළිවෙල කිරීම හුදෙක් ඇයගේ නොපසුබට උත්සාහයේ පලයකි. ඒ පිළිබඳ සවිස්තරාත්මක විවරණයක් මම පසුව කිරීමට බලාපොරොත්තු වෙමි. ඇයගේ මාර්ග දේශකත්වය යටතේ ක්ෂණික සහ කාර්යක්ෂම වාණිජ තොරතුරු සැපයීමේ සේවාවක් ඇති කිරීමෙහි ලා කාර්ය මණ්ඩලය සමත් වූ බව සඳහන් කළ යුතුය.

**අරමුණු :**

පහසුව තකා මේ දක්වා එහි අත්‍යවශ්‍ය හා වැදගත් අංශයක් වූ පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය තනි ඒකකයක් ලෙස සැලකුවෙමි. ඇත්ත වශයෙන් වාණිජ තොරතුරු සේවාව, තොරතුරු සැපයීමේ අංශය හා පුස්තකාලය යන අංශ දෙකකින් සමන්විත වේ. මහල් දෙකක් පුරා පැතිර ඇති පුස්තකාලයත්, එහි සේවය කරන නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයත් නිසා මේ අංශ දෙක අතර පැහැදිලි වෙනසක් දැකිය නොහැක.

පුස්තකාලයේ අරමුණු වාණිජ තොරතුරු ප්‍රවෘත්ති සේවාවේ අරමුණුවලින්ම පණ ගැන්වේ. පුස්තකාලයේ කාර්ය භාරය වූකලී, පර්යේෂණවලට අදාල තොරතුරු, ලිපි ලේඛන හා පොතපත ආදිය සැපයීමයි. ඒ උදෙසා ග්‍රන්ථ පත්‍රිකා ඈ වෙනත් කෘතීන් සම්භාරයක් මගින් තොරතුරු සපයනවා සේම, විශේෂඥතාවයකින් යුතුව සකසන ලද අනුක්‍රමණිකා හා සාරාංශ සේවා පුස්තකාලය පරිහරණය කරන්නවුනට සපයනු ලබයි. වාණිජ තොරතුරු සේවාවේ සඳහන් කරන ලද ඒක් එක් අරමුණුවලට අතිරේකව පුස්තකාලය පර්යේෂණ කටයුතු සඳහා ආධාර කරන අතර, ප්‍රවෘත්ති සපයා ගැනීම සහ ප්‍රකාශන හුවමාරුව සඳහා අනෙකුත් පුස්තකාල, වෙළඳ මණ්ඩලය, කානාපති කාර්යාල වාණිජ සංවර්ධන ආයතන සමග සම්බන්ධතා පවත්වනු ලබයි.

**ගොඩනැඟිලි සැලසුම:**

පුස්තකාලයට වර්ග අඩි 4653 ක් වූ ඉඩ ප්‍රමාණයක් ඇත. එය ගාලු පාරට යාබදව පිහිටි ගොඩනැගිල්ලක පිහිටුවා ඇති නිසා පහසුවෙන් ළඟා විය හැකිය. චිත්තාකර්ෂණීය ලෙස සැලසුම් කර ඇති අතර, එහි ලී බඩු සුව පහසු මෙන්ම, සිත් ඇද ගන්නා සුලුය. සඟරා ප්‍රදර්ශනය කර ඇති රාක්ක පුස්තකාලයේ ප්‍රධාන අංශයේ තබා ඇත. ප්‍රධාන ශාලාවෙහි මූලික විමර්ශන සහ අර්ථ කෝෂ එකතුවත්, දිවයිනේ තොරතුරු හා මග පෙන්වන ග්‍රන්ථ ('ඩිරෙක්ටරීස්') තබා ඇත. නිෂ්පාදන වාර්තා සහිතලිපි ගොනු වෙනම එකතුවක් වශයෙන් තබා ඇත්තේය. සංඛ්‍යා ලේඛන හා බදු ශාස්ත්‍ර පිළිබඳ විස්තර ඇතුළත් එකතුව ඊට යාබද මහලේ තබා ඇත්තේය. කුඩා කුහර සහිත රාක්ක ඇති විශේෂ කාමරයක් වෙන්ව ඇත්තේ බැංකු වාර්තා, විමර්ශන, ප්‍රවෘත්ති පත්‍රිකා සහ ආර්ථික පත්‍රිකා ආදිය සඳහාය. සඟරාවල් පසුගිය කලාප පොත් වශයෙන් බැඳ ප්‍රධාන ශාලාවෙන් ඔබ්බෙහි ඇති ධාතේ රාක්කවල ඇන්පත් කර ඇත.

ආර්ථික හා දිවයින පිළිබඳ වන පුස්තිකා පෙට්ටිවල අසුරා පවත්වාගෙන යනු ලබයි.

අරමුදල් :

වාණිජ තොරතුරු සේවාව සඳහා සැලකිය යුතු ප්‍රමාණයක අරමුදලක් ඇත. එය රජයෙන් ලැබෙන අරමුදලින් සහ අපනයන සංවර්ධන අංශ මගින් අන්තර් ජාතික වෙළඳ මධ්‍යස්ථානයෙන් (අයි.ටී.එස්.) සහ ස්වීඩන අන්තර් ජාතික සංවර්ධන අධිකාරිය (සිඩා) මගින් ලැබෙන අරමුදල්වලින් සමන්විත වේ. මෙම යෝජනා ක්‍රමය ආරම්භයේදී ඩොලර් 30,000 ක අරමුදලක් උපකරණ හා පොත්පත් මිල දී ගැනීම සඳහා ලබා දෙන ලදි. ඊට අතිරේකව හැම වසර කම මෙම යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරම සඳහා සුදුසු ප්‍රමාණයේ මුදලක් වෙන් කරනු ලබයි. අරමුදලින් අවම වශයෙන් 85% ක් වැය කරනු ලබන්නේ වාර සඟරා සඳහාය.

කාර්ය මණ්ඩලය :

වාණිජ තොරතුරු සේවාවේ කාර්ය මණ්ඩල පරිපාටිය අනුව නියමිත සුදු සුකම් සහිත 11 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයකින් එය සමන්විත වේ. මෙයින් පුස්තකාල කාර්ය මණ්ඩලය වෘත්තීය පුස්තකාලයාධිපතීන් දෙකුදනෙකුගෙන් සමන්විතය. ඒ හැර ලිපිකරුවෙකු සහ කාර්යාල කාර්ය සහායකවරයකුද ඊට අයත්ය. මෙහිලා කණගාටුවෙන් සඳහන් කළ යුත්තක් නම්, පුස්තකාලය මගින් සලසන විශේෂඥ සේවාවට අනුකූලව ඔවුනගේ වැටුප් පරිමාවත් ප්‍රමාණවත් නොවන බවයි.

ග්‍රන්ථ සම්භාරය :

වාර සඟරා: දළ වශයෙන් 545 ක් පමණ ඇති වාර සඟරා, තොරතුරු සැපයීමේ ප්‍රධාන මූලාශ්‍රයක් වී ඇති අතර, අරමුදලේ වැඩි කොටසක් එයට වෙන්වේ. මේ වාර සඟරා නිෂ්පාදන, වෙළඳ, අලෙවි කටයුතු සහ සාමාන්‍ය ආර්ථික සඟරාවලින්ද සමන්විත වන අතර, මේ අංශයට වෙළඳ හා වාණිජ

–ආර්ථික සඟරාවලින්ද සමන්විත වන අතර, මේ අංශයට වෙළඳ හා වාණිජ ක්ෂේත්‍රයේ විවිධ අංශ වලට අදාල විමර්ශන, ආර්ථික සහ වෙළඳ ප්‍රකාශන, සංඛ්‍යා ලේඛන ආදිය නිතිපතා ලැබේ.

<u>වාර්තා:</u> කාලීන තොරතුරු සැපයීමේ මූලාශ්‍රයක් හැටියට නිෂ්පාදන වාර්තා දැක්විය හැකිය. මේවායේ නිතර ප්‍රකාශිත නොවූ තොරතුරු අඩංගු වේ. එක්සත් ජාතීන්ගේ විවිධ සංවිධාන, අන්තර් ජාතික වෙළඳ මධ්‍යස්ථානය –(අයි.ටී.සී.) නිවර්තන කලාපීය නිෂ්පාදන ආයතනය (ටී.පී.අයි.) වැනි සංවිධාන හා ආයතන මගින් සහ අන්තර් ජාතික දේශීය හා වෙනත් මූලාශ්‍ර මගින්ද ප්‍රකාශයට පත් කරනු ලැබූ වාර්තා පුස්තකාලය ලබා ගනී.

<u>පොත්:</u> ග්‍රන්ථ සම්භාරය කාණ්ඩ 4,000 කට පමණ ආසන්න සංඛ්‍යාවකින් සමන්විතය. ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය, කර්මාන්ත හා කෘෂිකර්මය වැනි විෂයයන්ගෙන් එය සමන්විතය. ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ කේ. එස්. කුලතුංග මහතාගේ ප්‍රතිපත්තිය පරිදි, මෙය වඩාත් පළල් කිරිමටත්, හැකි තරම් දුරට අපනයනය කළ හැකි භාණ්ඩ සඳහා අලෙවි මූලාශ්‍ර අවධාරණය කිරිමටත්, ඒ සඳහා අවශ්‍ය තරම් මූලික විමර්ශන පහසුකම් සපුරාලීමටත් කටයුතු කෙරෙයි.

මෙම ප්‍රතිපත්තිය පරිදි, සමබර ග්‍රන්ථ සම්භාරයක් ගොඩ නගා ඇත්තේය. ඒ අනුව, පර්යේෂණ කටයුතු සඳහා පුස්තකාලයේ කරනු ලබන සේවාවන් විශාල වශයෙන් වර්ධනය කෙරේ. මේ හැරුණ විට පුස්තකාලයෙන් අභිප්‍රේත අරමුණුවලට සමාන්තරව, ශ්‍රී ලංකාවේ දේශීය ප්‍රකාශන එකතුව වටිනා මෙන්ම, වැදගත් එකතුවක් වශයෙන් තොරතුරු සපයන මූලාශ්‍රයක් වේ.

<u>ප්‍රමිති:</u> මෙය බෙහෙවින්ම ලංකා ප්‍රමිති කාර්යාංශයේ දේශීය ප්‍රමිති වන අතර, ඊට අතිරේක වශයෙන් අන්තර් ජාතික ප්‍රමිති කිහිපයක්ද වේ.

<u>පුස්තිකා:</u> ඇස්තමේන්තු කර ඇති අන්දමට පුස්තිකා 1,500 ක් පමණ වේ. පහසු විමර්ශනය සඳහා මේවා පෙට්ටිවල තැන්පත් කර ඇත.

<u>ප්‍රවෘත්ති පත්‍රිකා සහ බැංකු පත්‍රිකා:</u> මේවායේ මුලු ගණන 75 ක් පමණ වේ. වෙළඳ හා ආර්ථික කරුණු පිළිබඳ දත්තයන් මෙයට විෂය වී ඇත.

වෙළඳ සූචි : නිතිපතාම විවිධ රටවල වෙළඳ සූචි පුස්තකාලයට ලැබේ.

පුවත්පත්වලින් කපා ගත් ලිපි : කාලීන තොරතුරු ඇතුළත් මේවා සුදුසු පරිදි 'පෝ/ල්ඩර්ස්' වල පවත්වාගෙන යනු ලැබේ.

අන්තර්ජාතික උද්ධෘත සහ අනුක්‍රමණික සේවාවන් : පුස්තකාලය වෙත මෙවැනි ප්‍රකාශිත සේවා නිතිපතාම ලැබේ.

ආහාර හා කෘෂිකර්ම සංවිධානය (ඇෆ්.ඕ.ඒ.) හා එක්සත් ජාතීන්ගේ ප්‍රකාශන, ශ්‍රී ලංකා රජයේ සියලුම ප්‍රකාශන සහ දෙපාර්තමේන්තු ප්‍රකාශන රැගත් කෘති නිතිපතාම ලැබෙන අතර, ඒවා වෙන වෙනම රාක්කවල තැන්පත් කර ඇත.

## පරිග්‍රහන කටයුතු :

දේශීය හා විදේශීය කර්මාන්ත වාණිජ තොරතුරු සේවාවේ අධ්‍යක්ෂකවරයා-ගේ අනුමතිය ඇතිව, පුස්තකාලයාධිපති විසින් ඇණවුම් කරනු ලැබේ. පුස්තකාලයේ මෙම ද්‍රව්‍යවලින් සැලකිය යුතු ප්‍රමාණයක් පරිත්‍යාග වශයෙන් හෝ ආයතනයේ ප්‍රකාශන අන්‍යොන්‍ය වශයෙන් හුවමාරු කිරීමේ පදනම යටතේ ලබා ගනී.

## වර්ග කිරීම:

වර්ගීකරණ ක්‍රම තුනක් යොදාගෙන ඇති නිසාත්, ඇතැම් විට මේවා අතර අන්තර් සම්බන්ධතාවය නිසාත්, පුස්තකාලයේ වර්ගීකරණය තරමක් ගැටලු සහගත වී ඇත. වාණිජ දෙපාර්තමේන්තුවේ කාණ්ඩ 1760 ක් පමණ වන පැරණි ග්‍රන්ථ සම්භාරය කෙටියෙන් ඩිවි දශම වර්ගීකරණය අනුව වර්ග කර ඇති අතර, මූලික විමර්ශන සහ පර්යේෂණ එකතුව විශ්ව දශම වර්ගීකරණය අනුව වර්ග කර ඇත්තේය.

නිෂ්පාදන කටයුතු සම්බන්ධ ග්‍රන්ථ සම්භාරය අන්තර් ජාතික වෙළඳ වර්ග කිරීමේ ක්‍රම (එස්.අයි.ටී.සී.) අනුව වර්ග කර ඇත. 1975 දී ප්‍රකාශයට පත් කරන්නට යෙදුණ අන්තර් ජාතික වෙළඳ වර්ග කිරීමේ ක්‍රමය, දිවයිනේත් වෙළඳ කටයුතුවලත් ක්‍රියාකාරී පිළිවෙල සලකා පළ කෙරෙන්නකි. එය අන්තර් ජාතික වෙළඳ මධ්‍යස්ථානය (අයි.ටී.සී.) හා උත්ක්‍රාන්ති ගැට් මගින් වෙළඳ

කටයුතු සහ නාමාවලි ('ඩිරෙක්ටරීස්') විෂයයෙහි හඳුන්වා දෙන ලද්දකි. මෙම වර්ග කිරීමේ ක්‍රමය වෙළඳ කටයුතු පිළිබඳ ග්‍රන්ථාවලින්හි නිෂ්පාදන, දේශය හා කාර්යය යන තුන් ආකාරය සලකා ඒ විෂය ත්‍රය හසුවන පරිදි සකස් කරන ලද්දකි. මෙහිලා විශ්ව දශම ක්‍රමය වෙළඳ කටයුතු පිළිබඳ අවශ්‍යතාවලට අනුව වඩාත් විස්තරාත්මක නොවූයේය. එය ප්‍රමාණවත් නොවූවාසේම, එම විෂය පථයේ අභියෝගයනට මුහුණ දීමටද තරම් නොවීය.

**සූචිකරණය :**

සූචිකරණය මූලිකව ඒ.එල්.ඒ. නීති මාලාවට අනුව සිදු කෙරෙන අතර, අවශ්‍ය තත්හිදී කෙටි උද්ධෘත දැක්වේ. නව ක්‍රමය අනුව, සූචිකරණය ආරම්භ කිරීමට ප්‍රයත්නයක් දරා ඇත. සූචිය, නිෂ්පාදන - දේශය හා කාර්යය වශයෙන් අංශ තුනකට බෙදා ඇත.

**පාඨක පිරිස :**

පාඨක පිරිස පුළුල් වත්තෑක් මෙන්ම, විවිධත්වයෙන් යුතුය. ඔවුන් අතර අපනයන සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ව්‍යාපාරිකයන්, අලෙවි පර්යේෂකයන්, සහ ඊට සමාන්තර රජයේ දෙපාර්තමේන්තු සංස්ථා, ආයතනවල නිලධාරීන්ද වෙති.

**බැහැර දීමේ හා විමර්ශන සේවා :**

පුස්තකාලය එහි පාඨකයනට සහ පිළිගත් නැතහොත් බලය ලත් පුද්ගලයිනට විමර්ශනය සඳහා විවෘතව ඇත. බැහැර දීමේ සේවාවද ඔවුනට ලබා දී ඇත. ඒ හැරුණු විට සතියක කාලයකට පොත් බැහැර ගෙන යාමටද අවසර දෙනු ලබන අතර, ඒවායේ ඉල්ලුමම්හි ස්වරූපයද සලකා බලනු ලබයි. පර්යේෂණ ආයතනය වැනි මේ ආකාරයේම මහජනයාට විවෘතව ඇති විශේෂ පුස්තකාල සමග සේවාවන් බෙදා හදා ගන්නා බවද මම විශ්වාස කරමි.

## උපකරණ :

විශේෂ පුස්තකාලයන්හි සම්ප්‍රදාය අනුව යමින් වාණිජ තොරතුරු සේවා පුස්තකාලය නවීන උපකරණවලින් සමන්විතව ඇත. මුද්‍රණාලයක්, 'මයික්‍රො ෆිල්ම්' කියවනයක්, ජායාස්ථිති පිටපත් ගන්නා උපකරණයක්, පොත් බැඳීමේ උපකරණ සහිත අංශයක්, 'ස්ජ්යිරල්' ගණයේ පොත් බැඳීමේ යන්ත්‍රයක් සහ ස්ටේපලරයක්, කඩදාසි කපන යන්ත්‍රයක් යන අංගවලින් එය සමන්විතය. ඒ හැර කාඩ්පත්වල අනු පිටපත් ගන්නා උපකරණයක් සහ ලිපින යන්ත්‍රයක් එහි ඇත. 'ටෙලෙක්ස්' සේවාවක්ද, ප්‍රලේඛන මධ්‍යස්ථානය සහ ව්‍යාපාරිකයන්ගේ ප්‍රයෝජනය පිණිස පවත්වාගෙන යනු ලබයි.

## සේවාවන් :

(අ) ජායාරූප පිටපත් ලබා ගැනීමේ සේවාවන් මගින් ඉතා සුළු ගාස්තුවක් අය කර, ඉතාම කෙටි කාලයකදී ලියවිලිවල පිටපත් ලබා ගැනීමට අවකාශ සැලැස්වීම.

(ආ) කරනු ලබන ඉල්ලීම් අනුව, අනුක්‍රමණිකා පරියේෂණ කරනු ලබන අතර, එම තොරතුරු ඉල්වන අනුත්තා වෙත තැපෑලෙන්, දුර කථන මාර්ගයෙන් හෝ කලින් මුද්‍රණ ගැස්වීමෙන් සපයනු ලැබේ.

(ඇ) පරියේෂණයන්හි නිත්‍ය නිලධාරීන්ට තෝරා ගත් තොරතුරු ලැබීමට සැලැස්වීම.

(ඈ) පුස්තකාලයට ලැබෙන විවිධ කෘතීන්හි අනුක්‍රමණිකා සැකසීම හා ඒවා-යේ ග්‍රන්ථ නාම ලැයිස්තු බෙදා හැරීම.

(ඉ) වාර සඟරා 350 කට අධික ප්‍රමාණයක ලිපිවල සාර සංග්‍රහකරණය සහ ඒවා පුස්තකාලයෙහි පාඨක පිරිස අතර බෙදා හැරීම.

(ඊ) වාර සඟරා ක්‍රමයට ග්‍රන්ථ නාමාවලි පිළියෙල කර ඒ පරියේෂණ-යන්හි නිරත අය අතර බෙදා හැරීම.

**ප්‍ර කා ශ න :**

වාණිජ තොරතුරු සේවාව පොදුවේ ගෙන සලකන කල, ප්‍රකාශන ගණනාවක්ම නිකුත් කරනු ලබයි. "අපනයනකයින්ට මඟ පෙන්වීමක්" (අ ගයිඩ් ටු එක්ස්පෝටර්ස්') නමින් පත්‍රිකාවක් මූලිකව පළ කරනු ලබන අතර, එය ශ්‍රී ලංකාවේ අපනයන වැඩ පිළිවෙල මුලුමනින්ම විස්තර සහිතව මෙම ක්ෂේත්‍රයට පිවිසෙන අපනයනකරුවන්ට හඳුන්වා දෙන අත් පොතක්ද වෙයි. 'එක්ස්පෝ නිව්ස්' නමින් පළ කරනු ලබන මාසික වාර ප්‍රකාශනයක්ද වෙයි. වෙළඳ හා ආර්ථික දත්තයන්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ සඳහා අලෙවි අවස්ථාන පිළිබඳ පෙන්වා දීමක්ද සහිතව තොරතුරු මෙහි අඩංගු වේ.

මේ උදෙසා පුස්තකාලය පරිග්‍රහණය කරනු ලබන කෘතීන්හි ලැයිස්තුවක් සහ එමගින් පරිශීලනාත්මක ලිපි සඳහා උවමනා අමු ද්‍රව්‍ය සැපයීමෙන් සහාය වෙයි.

නිෂ්පාදන වාර්තා, අලෙවි සමීක්ෂණ සහ ප්‍රමිති පිළිබඳව, පුස්තකාලය මගින් පිළියෙල කොට බෙදා හරිනු ලබන ග්‍රන්ථ නාමාවලි වාර්ෂිකව ප්‍රසිද්ධ කරනු ලැබේ. "වෙළඳ අනුක්‍රමණිකාව' ('ට්‍රේඩ් ඉන්ඩෙක්ස්') ත්‍රෛමාසිකව පළ කෙරෙන්නකි. එය වාර සඟරාවල පළවන කාලීන ලිපි සාර සංග්‍රහකරණ සේවාවකි.

එම ප්‍රකාශන දෙකම පුස්තකාලයේ ප්‍රකාශන වෙයි. ඒවා අනෙකුත් පුස්තකාල, පරිශීලන නිලධාරීන්, පුස්තකාලයේ පාඨක පිරිස ආදී කොටස් අතර බෙදා හරිනු ලබන අතර, සෙසු අවශ්‍ය අයට ඉල්වා එවීමෙන් ලබා ගත හැකිය.

**විවෘත තර ඇති වේලාවන් :**

පුස්තකාලය විමර්ශන කටයුතු සඳහා පූ.භා. 8.00 සිට අ.භා.4.15 දක්වා මහජනතාවට විවෘතව ඇත. –

**පරිවර්තනය: පියසේන වික්‍රමගේ**

**විශේෂාංග/පුවත්**

## විවේකයෙන් වැඩිම වේලාව
## කියවීමට ගත කරන් ජනතාවක් :

විවේක අවස්ථාවලදී, විනෝදය සඳහා ජපනුන්ගේ කෙරෙන ප්‍රධානතම කාර්යයක් වනුයේ කියවීමයි; ජපානයේ වැසියන් වැඩ කරන සහ නිදා ගැනීමට ගත කරන කාලයට අමතරව, ඇඟි කාලයෙන් වැඩි කොටසක්ම කියවීම සඳහා ගත කරන බව පිළි ගැනීම වේ.

සෑම දිනකටම සාමාන්‍ය වශයෙන් අලුත් පොත් 63 ක් ජපන් වෙළඳපලට ඇතුළුවේ. ජපානයේ වෙසෙන සෑම ස්ත්‍රී, පුරුෂ සහ ළමා එක් අයකු වෙනුවෙන් පොත් 8 1/2 ක් වසරකදී පළවේ. මේ හැරුණු විට සෑම අංශයක් ගැනම ලියැවුණු වාර සඟරා රාශියක් සතිපතා, මාසිකව වර්ෂයකට සිව් වරක් හෝ වාර්ෂිකව පළවේ.

පුලුල් වශයෙන් කියවීමේ පුරුද්ද ජපනුන්ට ඔවුනගේ ඓතිහාසික සම්ප්‍රදායයෙන් උරුම වූවක් ලෙස සැලකේ. ඈත අතීතයේ පටන්ම අධ්‍යාපනය පිළිබඳ ඔවුන් තුළ විශාල උනන්දුවක් තිබුණි. අතීතයේ වැඩවසම් අවදියේ පවා ජපනුන් තුළ අසාමාන්‍ය අන්දමට උගත්කම පැවතුනි. මේ අන්දමට අතීතයෙන් උරුම වූ සම්ප්‍රදායයත්, වර්ධනය වන වර්තමාන අධ්‍යාපන ක්‍රමයත් නිසා මේ ජනතාව තුළ ඇති වී තිබෙන නව තොරතුරු දැන ගැනීමේ පිපාසාව සංසිඳුවීමට යාමෙන් පොත් ප්‍රකාශනය අද ජපානයේ අති විශාල ව්‍යාපාරයක් බවට පත්ව තිබේ. සෑම වසරකම පොත් කෝටි 80 ක් ජපානයේ මුද්‍රණය වේ.

ප්‍රකාශනය වන ආකාරයත් වාර්ෂිකව වේගයෙන් ඉහළ යයි. 9% කින් මුලු පොත් ප්‍රමාණයත්, 12% කින් අලුත් පොත් ප්‍රමාණයත්, 11% කින් සම්පූර්ණ මුද්‍රණ කාර්යයත්, 15% කින් පොත් අලෙවියද වාර්ෂිකව ඉහළ යයි.

වාර සඟරාවල තත්වයද මීට සමානය. සතිපතා ප්‍රකාශන අතර, සාමාන්‍ය වාර සඟරා 1,5000ක් පමණ 1975 දී ජපානයේ පළ වුනි. අද ජනප්‍රිය වාර සඟරා ජපානයේ ප්‍රධානතම ප්‍රකාශනයක් බවට පත්ව ඇත.

එරට පොත් ප්‍රකාශන සමාගම් 5000 ක් පමණ ඇත. නමුත් ප්‍රකාශනය වන පොත්වලින් විශාල ප්‍රමාණයක් දුසිමකට නොවැඩි ප්‍රකාශන සමාගම්වලින් ඒකාධිකාරී අන්දමට පාලනය කෙරේ.

## මණ්ඩලීය පුවත්

**මණ්ඩලීය පුස්තකාල අධ්‍යාපන වැඩ පිළිවෙලින්**

**1977 වර්ෂයේ පුහුණු පාඨ මාලා දහයක් !**

1977 වර්ෂයෙහි ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල මූලස්ථාන පුස්තකාල සේවා අංශය මගින්, පුස්තකාල අධ්‍යාපන වැඩ පිළිවෙල යටතේ සේවා යුක්ත පුස්තකාල පුහුණු පාඨමාලා දහයක් පවත්වන්නට හැකි වී ඇත.

මෙම පාඨමාලා ප්‍රාථමික හා උසස් යනුවෙන් මට්ටම් දෙකකින් යුතුව පවත්වන්නට යෙදුන බව විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. උසස් මට්ටමේ පාඨමාලා මෙම වර්ෂයේදී අරඹන්නට යෙදුන විශේෂාංගයකි.

මේ පාඨ මාලා අතුරින් මහ පුස්තකාල සේවින් සඳහා පාඨමාලා අටක්ද, ගුරු පුස්තකාල සේවින් සඳහා පාඨ මාලා එකක්ද, ප්‍රජා මණ්ඩල නිලධාරීන් සඳහා එක් පාඨමාලාවක්ද පවත්වන්නට යෙදී ඇත.

පාඨමාලාවලට සහභාගී වූ පුස්තකාල සේවින්ගේ සංඛ්‍යාව 247 ක් පමණ වේ.

මේ පාඨමාලා අතුරින් නවයක් කොළඹ පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පවත්වන ලද අතර, ගුරු පුස්තකාල සේවින්ගේ පාඨමාලාව ගාල්ලේ උණවටුන ගුරු විද්‍යාලයේදී පවත්වා ලදී.

මේ පාඨමාලා අතුරින් අටක් සිංහල මාධ්‍යයෙන්ද, දෙමළ මාධ්‍යයෙන් පාඨ මාලා දෙකක්ද වශයෙන් පවත්වන ලදී.

## මණ්ඩලීය පුවත්

### මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් පුස්තකාල සේවීන් 150 කට පුහුණුව

1977 වර්ෂයේදී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් මහජන හා පාසල් පුස්තකාල සේවීන් සඳහා වන සේවාස්ථ පුහුණු පාඨමාලා පහක් පවත්වන්නට යෙදුන බව වාර්තා වෙයි.

මෙම පුස්තකාල අධ්‍යාපන වැඩ පිළිවෙල යටතේ පුහුණුව ලැබූ පාසල් හා මහජන පාසල් පුස්තකාල සේවීන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 152 ක් පමණ වෙයි.

මෙයින් එක් පාඨමාලාවක් අනුරාධපුර ගුරු විද්‍යාලයේ පැවති අතර, ඉතිරි පාඨමාලා මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේම පවත්වන ලද බව සඳහන්වේ.

මහනුවර, මාතලේ, නුවර එළිය, කෑගල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර හා කුරුණෑගල යත දිස්ත්‍රික්කයන්ගෙන් පැමිණි පුස්තකාල සේවීන් මෙම පාඨමාලා සඳහා සහභාගි වූ බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුත්තකි.

---

### ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පිළිබඳ නාමාවලියක්...

ශ්‍රී ලංකාවේ ඇති සියලුම මහජන පුස්තකාල පිළිබඳ තොරතුරු ඇතුළත් නාමාවලියක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ, පුස්තකාල සේවා අංශය මගින් ළඟදී ප්‍රකාශයට පැමිණවීමට අවශ්‍ය මූලික කටයුතු සියල්ලම අවසාන කර ඇත.

මෙම තොරතුරු සංග්‍රහයට ශ්‍රී ලංකාවේ සෑම මහජන පුස්තකාලයකම පොත් ප්‍රමාණය, වාර සඟරා ප්‍රමාණය, පුස්තකායාධිපතිවරයා සහ ඔහුගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, අනෙකුත් පුස්තකාල සේවීන්ගේ සංඛ්‍යාව, වාර්ෂිකව පුස්තකාල ද්‍රව්‍ය සඳහා වැය වන මුදල් ප්‍රමාණය ආදී විවිධ තොරතුරු අඩංගු වේ.

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවාවන් පිළිබඳ උනන්දුවක් දක්වන අයටත්, විවිධ පර්යේෂණ කටයුතුවල නිරත වී ඇති අයටත්, පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හැමටත් මෙම නාමාවලිය විශාල මෙහෙයක් කරනවා ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ
සේවක සුභසාධක සංගමයේ වාර්ෂිකය - 1978

සම්මාන සංස්කාරක : එන්. අමරසිංහ

සංස්කරණය හා පිටු සැලැස්ම : පියසේන වික්‍රමගේ

මිල: 3.50

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සේවක සුභසාධක සංගමයේ මගින් තම කුළුඳුල් වාර්ෂික සඟරාව " සංවාද " නමින් නොබෝදා ප්‍රකාශනය කරන ලදී. පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යාව මෙයට විෂය කොට ගෙන තිබෙන අතර, පොත් සහ පුස්තකාල ක්ෂේත්‍රයේ තියැලී කටයුතු කරන ප්‍රවීනයන් කිහිප දෙනෙකුගේ ලිපි නවයක් හා දැනුම වඩන විශේෂාංගයක්ද මේ කලාපයේ අඩංගු වී ඇත.

වර්තමාන යුගයේ පුස්තකාල සංකල්පය, එයින් අපේක්ෂා කරන කාර්යයන්, පොත්පත් බෙදා හැරීම, පුස්තකාල ගොඩනැගිලි, "ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල සේවය, ලංකාවේ මහජන පුස්තකාල මුහුණ පාන ගැටලු ආදී පුස්ත-කාල ක්ෂේත්‍රයේ පොදු හා ලංකාවට සුවිශේෂ වූ විවිධ අංශ කෙරෙහි ලේඛක යන් අවධානය යොමු කොට ඇත. සුප්‍රකට චිත්‍රපට අධ්‍යක්ෂ ලෙස්ටර් ජේම්ස් පීරිස් සමග කළ සාකච්ඡාවකින් සැකසී ඇති " චිත්‍රපට පුස්තකාල " නමැති ලිපිය මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. එහිදී චිත්‍රපට සංරක්ෂණය කරන චිත්‍රපට පුස්තකාලවල කාර්ය භාරය ගැනත්, ලංකාවේ එබඳු පුස්තකාලයක ඇති වැදගත්කම ගැනත් අවධාරණය කර ඇත.

ලංකාවට අලුත් දෙයක් වූ චිත්‍රපට පුස්තකාල පිළිබඳ සාර්ථක ඇගයීමක් ලෙස්ටර් පීරිස් විසින් මෙහිදී සිදු කොට ඇත.

"ජාතික පුස්තකාල සේවයට සිංගප්පූරුවෙන් ආදර්ශයක්!" නම් ලිපි-යෙන් සිංගප්පූරු ජාතික පුස්තකාලය පිළිබඳව හැඳින්වීමක් කරන අතරම, පුස්ත-කාලයක් තුළදී, පුස්තකාල සේවක මෙන්ම - පාඨක යන දෙපක්ෂයේම යුතුකම් පිළිබඳවද හැඟීමක් ලබා දෙයි.

"ලංකාවේ මහජන පුස්තකාල මුහුණ පාන ගැටලු" නැත ඇති ලිපියේ මේවාට හේතු සාධක වූ නීතිමය දුබලතා, ගොඩනැගිලි ඌනතා, පුහුණු පුස්තකාල සේවීන්ගේ හිඟය, පොතපත් හිඟය වැනි විවිධ කරුණු සාකච්ජා කර ඇත.

19වන පිටුවෙන්...

"පුස්තකාලවිලින් ග්‍රාමීය පෙදෙස්වලට පොත් බෙදා දීම " යන ලිපියෙන් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මහනුවර නියාමක ව්‍යාපාරය ගැනත්, එබඳු කාර්යයකදී මුහුණ පාන ගැටලුත් සාකච්ඡා කර ඇත.

පොදුවේ ගත් කල "සංවාද" සඟරාව කරුණු කිහිපයක් නිසා අගය කළ හැක. පුස්තකාල ප්‍රවෘත්ති විද්‍යා ක්ෂේත්‍රයේ වර්තමානයේ මුහුණ පාන ප්‍රබල ඌනතාවයක් වූ දේශීය භාෂාවෙන් ලියවුන ලිපි ලේඛන හිඟයට පිළිතුරක් දීමට කළ උත්සාහයක් වශයෙන් අගය කළ හැක.

සඟරාවට ලිපි තෝරා ගැනීමේදී අදාල ක්ෂේත්‍රය පිළිබඳව මනා තුලනතාවයකින් යුක්තව ලිපි ඉදිරිපත් කර ඇත.

ලේඛකයින් සියළු දෙනාම පාහේ අදාල ක්ෂේත්‍රයේ විවිධ අංශවල සේවය කරන අය වන අතර, මේ පිළිබඳ තම අත්දැකීම් පදනම් කරගෙන ප්‍රයෝජනවත් කරුණු ඉදිරිපත් කර ඇත. අවශ්‍ය මූලික පහසුකම් හෝ නිසි මග පෙන්වීමක් නොමැතිව, දිවයින පුරා විසිරී සිටින මහජන හා පාසල් පුස්තකාල සේවක රාශියකටත්, පුස්තකාල හා ප්‍රවෘත්ති විද්‍යාව හදාරන සිසුන්ටත්, මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයටත් " සංවාද " සඟරාව විශාල මෙහෙයක් කරන බව කීම අතිශයෝක්තියක් නොවනු ඇත.

– එම්.එස්.යූ. අමරසිරි

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොත් රැස් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොත් එකතු කිරීම ආරම්භ කළ බව සතුටින් නිවේදනය කරනු ලැබේ.

තෑගි වශයෙන් හෝ වෙනත් අයුරකින් ශ්‍රී ලංකාවේ භාෂා, ශාස්ත්‍ර, විද්‍යා, ඉතිහාස යනාදී විෂයයන්ට අදාල පොත් පත් ලබා ගැනීමට ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට උපකාරී වන ලෙස ශාස්ත්‍රාභිලාෂී සියළු දෙනාගෙන්ම කරුණාවෙන් ඉල්වා සිටිමි.

සභාපති
ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලය

74, ඩේව්ඩ්සන් පාර
කොළඹ 4.

## පාඨකයන්ගෙන් ඉල්ලීමක්

"පුස්තකාල ප්‍රවෘත්ති" සඟරාවේ පළ කිරීම සඳහා සුදුසුදැයි සලකා බැලීම පිණිස ප්‍රවෘත්ති, ලිපි ලේඛන, විශේෂාංග එවන ලෙස ආරාධනය කරනු ලැබේ.

අදාල ක්ෂේත්‍රයන් පිළිබඳ පොතපත, සඟරා, පත්‍රිකා විචාරය සඳහාද එවිය හැකිය. අවකාශ ඇති පරිද්දෙන් මේවා පළ කෙරෙනු ඇත.

පළ නොවන ලිපි ආපසු ගෙන්වා ගැනීම සඳහා ලිපිනය සහිත මුද්දර ගැසූ
ලියුම් කවරයක් එවිය යුතුය.

–සංස්කාරක

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/13
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*